**ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ ව්‍යාපෘතිය - 2015**

---

**ජලය හා සනීපාරක්ෂාව පිළිබඳ** ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ප්‍රථම ගිණුම් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා සාර්ක් සංවර්ධන අරමුදල අතර 2014 දෙසැම්බර් 17 දින එළඹි ප්‍රදාන ගිවිසුමේ 3.3 ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

---

ප්‍රදාන ගිවිසුම අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනය වේ. ග්‍රාමීය වාරිමාර්ග පද්ධතිවල ජලය සහ පරිසර පද්ධති යටතේ යැපෙන ග්‍රාමීය ප්‍රජාවගේ ග්‍රාමීය ජන ජීවිතයේ ජීවන තත්ත්වය සහ චිරස්ථායී සංවර්ධනය වැඩි දියුණු කිරීම සහ මඩකලපුව හා මොනරාගල දිස්ත්‍රික්කවල ගම්මාන 09කට අයත් ජල පෝෂක සහ වාරිමාර්ග පද්ධති යටතේ ජීවත්වන ප්‍රතිලාභී පවුල් 2800 ක ජල කාර්යක්ෂමතාවය ඉහළ නැංවීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එ.ජ.ඩො මිලියන 0.94 කට සමාන රු.මිලියන 119 ක් වූ අතර එය මූල්‍යායනය කිරීම සඳහා සාර්ක් සංවර්ධන අරමුදල එකඟ වී තිබුණි. මෙම ව්‍යාපෘතියේ කටයුතු 2014 දෙසැම්බර් 17 දින ආරම්භ කළ අතර 2017 දෙසැම්බර් 16 දිනට නිම කිරීමට අපේක්ෂිතය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල  දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ප්‍රදානය කරනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ප්‍රදානය යටතේ මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ප්‍රදානය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ප්‍රදානය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

---------------

**2.1 මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා  ඇති බව සහ 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට  අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා අයෝජනය කර තිබුණු බව,

(ඇ) ප්‍රදාන ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව,

**2.2 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩුව**

මොනරාගල දිස්ත්‍රික්කයේ වැව් දෙකක් පුනරුත්ථාපනය කිරීම සඳහා ලබා දී තිබූ රු.400,000 ක් වූ සචලීකරණ අත්තිකාරම් මුදල වියදමක් ලෙස සලකා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

සමාලෝචිත වර්ෂය තුළ මුල්‍යායනය, අයවැයගත ප්‍රතිපාදන සහ පළමු ගිණුම් වර්ෂය තුල අරමුදල් උපයෝජනයට අදාල වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් දැක්වේ.

| ප්‍රභවය | ප්‍රදාන ගිවිසුම්අනුව මූල්‍යායනය කිරීම සඳහා එකග වූ වටිනාකම | | සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අයවැය ප්‍රතිපාදනය | 2015 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එ.ජ.ඩො මිලියන | රු. මිලියන |
| සාර්ක් සංවර්ධන අරමුදල | 0.94 | 119 | 40.4 | 0.034 | 4.9 |

3.2 **භෞතික ප්‍රගතිය**

ව්‍යාපෘති සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුල ආරම්භකර ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ කාර්යයන් වන ජලය පදනම් කරගත් දත්ත පාදමක් සංවර්ධනය කිරීම, පරිසර පද්ධති කළමනාකරණය පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම, ජලාශ්‍රිත යටිතල පහසුකම් සංවර්ධනය, ඉඩම් ඵලදායිතාවය පිළිබඳ සිතියම් සහ ඉඩම් භාවිත සැලසුම් සකස් කිරීම හා සංරක්ෂණය කිරීම, ක්ෂුද්‍ර වාරිප්‍රදේශ හඳුනා ගැනීම හා රජයේ නිලධාරීන් පුහුණු කිරීම වැනි කාර්යයන් ක්‍රියාත්මක කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, ගොවි නායකයන්ගේ කුසලතා සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ කතරගම ප්‍රදේශයේ පදිංචිව සිටින ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් දෙකක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ පවත්වා තිබුණි.

**3.3 කොන්ත්‍රාත් පාලනය**

රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 ( අ ) වගන්තියට පටහැනිව, ජලය ආශ්‍රිත යටිතල පහසුකම් සඳහා උපකරණ හා කාර්යාලීය උපකරණ මිල දී ගැනීම සඳහා වූ ප්‍රසම්පාදන කමිටුවට හා තාක්ෂණික ඇගයීම් කමිටුවට එකම සාමාජිකයන් පත්කර තිබුණු බව නිරීක්ෂණය විය. තවද, ලංසු ඇගයීම් කළ වටිනාකම රු. මිලියන 1.56 ක් වූ අයිතම 223 ක් සඳහා තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම අදාල උපකරණ වල විස්තර 2015 දෙසැම්බර් 31 දිනට බඩු වට්ටෝරු ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.